// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2459/15 – 2025 ඔක්තෝබර් මස 22 වැනි බදාදා – 2025.10.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගම්පල් කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 101 වහරක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වහරක ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KE/RWN/2022/313 හා 2022.11.03 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර A - මහකන්ද ජනපදය - ප්‍රමාණය: හෙක්. 0.0432**

උතුරට: මු.පි.කෑ 3791 හි බිම් කැබලි අංක 19; නැගෙනහිරට: ටී.ඒ. ෂෙල්ටන් සරත්චන්ද්‍ර හිමිකම් කියන මහකන්ද ජනපදය; දකුණට: ටී.ඒ. ෂෙල්ටන් සරත්චන්ද්‍ර සහ ඒ.ඒ. බන්දුල ජිනසෝම හිමිකම් කියන මහකන්ද ජනපදය සහ මු.පි.කෑ 3791 හි බිම් කැබලි අංක 23; බටහිරට: මු.පි.කෑ 3791 හි බිම් කැබලි අංක 19.

02. **කැබලි අක්ෂර B - මහකන්ද ජනපදය - ප්‍රමාණය: හෙක්. 0.0297**

උතුරට: මු.පි.කෑ 3791 හි බිම් කැබලි අංක 42 සහ 30; නැගෙනහිරට: මු.පි.කෑ 3791 හි බිම් කැබලි අංක 30; දකුණට: එච්.වී. සෝමාවතී හිමිකම් කියන මහකන්ද ජනපදය; බටහිරට: එච්.වී. සෝමාවතී සහ ඩබ්ලිව්.ඒ. චන්ද්‍රසේන හිමිකම් කියන මහකන්ද ජනපදය .

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2021/IR/382.
2025 සැප්තැම්බර් මස 04 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර ",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 10 – 0207